৭ ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1437/25 – 2006 මාර්තු 23 වැනි බ්‍රහස්පතින්දා – 2006.03.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී.-2/2006.

### 2006 අංක 6 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ පනත

2006 අංක 6 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ පනතේ 29 වන වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු, ඉහත කී පනතේ 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2006 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2006 අංක 1 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ නියෝග ලෙස නම් කරනු ලැබේ.

2. 2006 අංක 6 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ පනතේ අර්ථානුකූලව වූ සෑම ආයතනයක් විසින්ම ඉහත සඳහන් පනතේ 6 වන වගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර, ගණුදෙනුකාරයෙකුගේ ඉල්ලීම මත සිදු කරන විද්‍යුත් අරමුදල් මාරුවක් පිළිබඳ වූ සෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඒ මුදල් ප්‍රමාණය, මුදලින් රුපියල් ලක්ෂ පහක් (රු. 5,00,000) හෝ ඊට සමාන විදේශ මුදල්වලින්වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවක අවස්ථාවක දී මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතුය.